**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 17 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,244.23 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,022.30 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 221.93 හෙවත් සියයට 17.84 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 949.43 | 944.99 | 4.44 | 0.47 |
| මූලධන | 294.80 | 77.31 | 217.49 | 73.78 |
| **එකතුව** | **1,244.23** | **1,022.30** | **221.93** | **17.84** |

**(ආ)** වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් එකතුව රු.මිලියන 5,812.62 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 5,534.27 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදන වලින් රු. මිලියන 278.35 ක් හෙවත් සියයට 4.79 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂයය අංක 25601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 75.90 | 64.42 | 59.90 | 64.80 | 250.00 | 228.59 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අංක 7002/0000/000/0303/0015/000 දරන අග්‍රිම ගිණුමෙ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 52.17 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 6 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 705.07 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0061/000 | 0.01 |
| 6000/0000/00/0002/0079/000 | 0.64 |
| 6000/0000/00/0013/0049/000 | 32.68 |
| 6000/0000/00/0016/0031/000 | 269.28 |
| 6000/0000/00/0017/0010/000 | 399.75 |
| 6000/0000/00/0018/0039/000 | 2.71 |
| **එකතුව** | **705.07** |

**2.5 විගණන නිරීක්ෂණය**

----------------------

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

3.1 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි |
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 භාණ්ඩාගාර චක්‍රලේඛය | -එම- |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 නෙවැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | - එම -. |

**3.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන**

---------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ මහජන නියෝජිත වැඩසටහන් යටතේ මිලදී ගෙන තිබූ වටිනාකම රු.1,061,595 ක් වූ භාණ්ඩ හා උපකරණ වර්ග 8 ක ඒකක 261 ක් 2016 ජනවාරි මාසය වන විටත් නොබෙදා පැවතුණි.

(ආ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රජා ජල යෝජනා ක්‍රම 2 ක් ඉදි කිරීම සඳහා 2012 වර්ෂයේ රු.1,726,744 ක් වැය කර තිබූ අතර, එකී ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් සාවද්‍ය ගණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක් විසින් රු.15,277,332 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

3.3 **පොදු තැන්පත් ගිණුම**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 කට අදාළව වර්ෂ 2 ක් ඉක්මවූ රු.3,221,479 ක්වූ තැන්පතු 137 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3ක තැන්පත් කර වර්ෂ 10 ඉක්මවූ රු.6,107,605 ක් වූ ඉඩම් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආබාධිත අයෙකුට නිවාස ආධාර ලබා දීම සඳහා ලබා දෙන ලද රු.100 000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් නොකර 2014 දෙසැම්බර් මාසයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පොදු තැන්පත් ගිණුමේ වසර 02 කට අධික කාලයක සිට රඳවාගෙන තිබෙන හඳුනා ගත නොහැකි වූ මුදල් හා මුද්දරවල වටිනාකම රු.105,038 ක් වී තිබුණි.

3.4 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------**

විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිග හිට තිබුණු ශේෂවල එකතුව රු.2,185,294 ක්වූ අතර එම හිග හිටි ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත් එම හිග හිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතු වටිනාකම රු.231,376,873 ක් වූ අතර පාලන ගිණුම අනුව එම ශේෂය රු.231,397,342 ක් වීමෙන් රු.20,469 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**------------------------------------**

3.5.1 **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**---------------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

3.5.2 **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

 2002 දෙසැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජූනි 25 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

3.6 **දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| (i) | දින 100 වැඩ සටහන යටතේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අනුමත වී තිබුණු ව්‍යාපෘති 16 ක් | 9,100,000 | 2015.12.31 දිනට පෙර | වර්ෂාව සහිත අයහපත් කාළගුණික තත්ත්වය |
| (ii) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ දින 100 වැඩ සටහන යටතේ 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අනුමත කළ ව්‍යාපෘති 5 ක් | 2,494,836 | 2015.12.31 දිනට පෙර | ප්‍රමාදයට හේතු ඉදිරිපත් කර නොතිබුණි. |

3.7 **කාර්යසාධනය**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරයන් පිළිබඳ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන් තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කීපයක් පහත දැක්වේ.

(අ) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ අරමුණින් කිරි ගවයන් 364 ක් රු.18,200,000 ක් වැය කර කිරි ගොවීන් වෙත ලබාදීමට සැලසුම් කර

තිබුණි. 2014 හා 2015 වර්ෂවලදී කිරි ගවයන් 197 ක් පමණක් බෙදා හැර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි ප්‍රගතිය සියයට 54 ක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බුලත් වගාකරුවන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වගාකරුවන් 350 දෙනෙක් සඳහා බුලත් කණු ලබා දීමට 2014 අවිච්ඡේද ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,512,546 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට බුලත් වගාකරුවන් 69 දෙනෙක් සඳහා පමණක් බුලත් කණු බෙදාදී තිබූ අතර, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 20 ක් පමණක් වී තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

---------------------

ස්වයං රැකිවා ව්‍යාපෘති සඳහා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් නිකුත් කරන ලද එකතුව රු.1,588,906 ක් වටිනා චෙක්පත් 45 ක් ආයතනයට ගිණුමක් නොමැති වීම, ආයතනය වසා තිබීම, ආයතනයේ හිමිකරු මියගොස් තිබීම, නුසුදුසු ප්‍රතිලාභීන් ලෙස තහවුරු වීම යන හේතු මත එම චෙක්පත් වටිනාකම ආදායමට බැරකර තිබුණි. මේ හේතුව නිසා භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි අනුගමනය කර නොතිබීම, සුදුසු ප්‍රතිලාභීන් හඳුනාගෙන නොතිබීම, උපකරණ මිලදී ගන්නා ආයතන පිළිබඳ දැනුවත් නොවීම හා නිසි අධීක්ෂණයක් නොතිබීම යන හේතු මත මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ය වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් ස්වයං රැකියාලාභීන්ට අදාළ ප්‍රතිලාභ ලබාදීමට නොහැකි වී තිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා අනාවරණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් භාරයේ රඳවාගෙන තිබෙන බාලවයස්කාර ඉතිරි කිරීමේ ගිණුම් පොත් බාල වයස්කරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමේදී එම අය වෙත නිදහස් කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 ක වයස අවුරුදු 18 ක් සම්පූර්ණ වු ළමුන් 17 දෙනෙකුගේ ඉතිරි කිරීමේ ගිණුම් පොත් එසේ නිදහස් කර නොතිබුණි.

(ආ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 6 කගේ අධ්‍යාපන සහතික වල නිවැරදිභාවය අදාළ ආයතන වෙතින් සහතික කර ගෙන නොතිබුණි.

(ඇ) කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව වයස අවුරුදු 18 ට අඩු පාසල් නොයන ළමුන් 91 ක ගෙන් ළමුන් 21 දෙනෙක් ළමා ශ්‍රමිකයින් බව නිරීක්ෂණය විය.

(ඈ) කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශයේ පවුල් 69025 ක ගෙන් ජලය නොමැති පවුල් 355 ක් ද, වැසිකිළි නොමැති පවුල් 591 ක් ද, සිටින බව අනාවරණය විය.

(ඉ) කටාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම් වල වර්ෂ 15 ක පමණ කාලයක සිට අනවසර පදිංචිකරුවන් 256 දෙනෙකු පදිංචිව සිටින බව නිරීක්ෂණය විය.

(ඊ) දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් කර ගැනීමේ ලේඛනය අනුව රජයේ විවිධ අරමුණු සඳහා ඉඩම් ආඥා පනතේ 38(අ) අතුරු විධානය යටතේ අවස්ථා 5 කදී ඉඩම් අත්පත් කර ගැනීම් සිදුකර තිබුණි. එම ඉඩම් අත්පත් කර ගෙන වර්ෂ 10 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණත්, ඉඩම් හිමියන් සඳහා වන්දි මුදල් ගෙවා නිරවුල් කර නොතිබුණි.

(උ) කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව අවස්ථා 09 කදී ගෙවිය යුතු රු.10,095,425 ක වන්දි මුදල් අදාළ පුද්ගලයන් හෝ ආයතන හඳුනාගෙන ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) නිවැරදි තොරතුරු ලබාගෙන නිසි පරීක්ෂා කිරීමක් හා අධීක්ෂණයක් සහිතව කාර්යාල ක්‍රම සැලැසුම් කර එදිනෙදා ගෙවීම් කටයුතු පරිපාලනය කර ගෙන නොතිබුණි. මේ නිසා ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේදී අවස්ථා 06 දී චෙක්පත් 69 ක් සම්බන්ධයෙන් දින දීර්ඝ කිරීම , හිලව් චෙක්පත් ලිවීම, රේඛනය අවලංගු කිරීම, නම වෙනස් කිරීම, දිනය වෙනස් කිරීම, මුදල වෙනස් කිරීම,චෙක්පත් අහරු වීම, ගිණුම් අංකය නිවැරදි කිරීම හා ආදායකයාගේ ගිණුමට පමණයි යන්න අවලංගු කිරීම මත නව චෙක්පත් ලබා දී තිබුණි.

(එ) විශ්‍රාම වැටුප් හිමියකු මියගිය විට අදාළ වසමේ ග්‍රාම නිලධාරී විසින් දින 07 ක් ඇතුළත මරණය සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දිය යුතුව තිබුණි. නමුත් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගිය විශ්‍රාමිකයන් 7 දෙනෙකු සම්බන්ධ එම තොරතුරු අදාළ ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැණුම් දීම මාස 4 ක සිට මාස 10 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කිරීම නිසා එකතුව රු.911,444 ක විශ්‍රාම වැටුප් අදාළ තැපැල් කාර්යාලය/ බැංකුව වෙත යවා තිබුණි. එම කාර්යාල විසින් නොගෙවන ලද විශ්‍රාමික වැටුප් මාස ගණනාවක් රඳවාගෙන තිබුණි.

(ඒ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලබා ගන්නා සියලුම විශ්‍රාමිකයන් තමන් ජීවත් වන බවට ජීවිත සහතිකයක් අදාල වර්ෂය ආරම්භයේදීම ග්‍රාම නිළධාරී මගින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, විශ්රාම වැටුප් ලබන පුද්ගලයන් 746 දෙනෙකු 2016 මාර්තු 31 දින වන විටත් ජීවිත සහතික ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) මීගමුව හා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අක්‍රීය තත්ත්වයේ පැවති විශ්‍රාම වැටුප් ලිපිගොනු 3895 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඕ) 2015 ජුනි 25 දිනැති අංක 16/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සේවය සඳහා 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වූ වැටුප් ව්‍යුහය අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැතිය යුතුව තිබුණු විශ්‍රාම වැටුප් ලිපිගොනු 109 කින් ලිපිගොනු 75 ක් කාර්යාලයේ නොතිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 45 | 01 |
| (ii) | තෘතීයික මට්ටම | 27 | 17 | 10 |
| (iii) | ද්විතියික මට්ටම | 3,076 | 2,645 | 431 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 124 | 109 | 15 |
| | **එකතුව** | **3,273** | **2,816** | **457** |